අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/59/04/05/21(තාවI) ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2024.04.26

ස. ප. අං: ..............

Mr./ Ms. ..................................................................

..................................................................

..................................................................

**<u>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම (සීමිත) 2019 (2020) – යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම.</u>**

අති විශේෂ ගැසට් අංක 1925/37 හා 2015.07.28 දිනැතිව පලකරන ලද සහ එදින සිට ක්‍රියාත්මක ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා ව්‍යවස්ථාව හා එයට වරින් වර කරන ලද සංශෝධන ප්‍රකාරව III ශ්‍රේණියට නිලධාරීන් බඳවා ගැනීම සඳහා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ ඔබ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන බව සතුටින් දන්වා සිටිමි.

02. පහත සඳහන් විෂය/ විෂයයන් යටතේ ඊට ඉදිරියෙන් දක්වා ඇති දින/ දිනයන්හි දී බත්තරමුල්ල, පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ 04 වන මහලේ ශ්‍රවණාගාරයට පැමිණෙන ලෙස කාරුණිකව දන්වමි.

| විෂය | දිනය | වෙලාව | මණ්ඩල අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

03. එදින ඔබගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා මෙම කැඳවීම් ලිපිය සහ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු වේ. **අතිරේක සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමට** පහත සඳහන් සියළු ලිපි ලේඛනවල මුල් පිටපත් ගොනුවක් සහ එම ලිපි ලේඛනයන්හි ඔබ විසින් සත්‍ය පිටපත් බවට සහතික කරන ලද ඡායා පිටපත් ඇතුලත් කර ඊට අනුරූපි ගොණුවක් ද වශයෙන් පහත අනුපිළිවෙළට සකස් කරන ලද ගොනු දෙක (02) ක් ඔබගේ සම්මුඛ පරීක්ෂණ අංකය, මණ්ඩල අංකය, විෂය සහ නම සඳහන් කර (www.moe.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති ලිපි ගොනු කවර ආකෘතිය බාගත කරගත යුතුය) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතුය. ඔබ විෂයයන් එකකට වැඩි ප්‍රමාණයක් සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවකු නම් එක් එක් විෂය සඳහා වෙන වෙනම ගොනු ඉදිරිපත් කළ යුතුය.

i. සම්පූර්ණ කරන ලද ඇමුණුම I ආකෘතිය (www.moe.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර බාගත කරගත යුතුය.) මෙහි මුල් පිටපත ඡායා පිටපත් ගොනුවට ඇතුලත් කිරීම ප්‍රමාණවත්ය.

ii. මූලික සුදුසුකම් සඳහා අයත් නොවන අධ්‍යාපනය හෝ අදාළ විෂය පිළිබඳ පශ්චාත් උපාධි සහතික

iii. මූලික සුදුසුකම් සඳහා අයත් නොවන පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික

iv. දෙවන බස සිංහල/ දෙවන බස දෙමළ විෂයයන් යටතේ ලිඛිත විභාගය සමත්වී ඇත්නම්, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සිංහල / දෙමළ II මට්ටම සමත් හෝ අ.පො.ස.(සා.පෙළ) දෙවන බස සිංහල/ දෙමළ විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ වාචික පරීක්ෂණය සමත්වීමට අදාළ සහතික
(මේ යටතේ දෙවන බස සිංහල විෂය සඳහා දෙමළ භාෂා සහතික ද දෙවන බස දෙමළ විෂයය සඳහා සිංහල භාෂා සහතික ද සඳහා ලකුණු ලබා දෙනු ලැබේ)

v. බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ උපලේඛන I හි අංක 02 යටතේ ඉංග්‍රීසි භාෂා නිපුණතාවයට අදාළව ලබා ඇති සහතික (ඉංග්‍රීසි විෂය යටතේ විභාගය සමත් අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබූ සහතිකවලට අමතරව ලබා ඇති සහතික)

vi. බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ උපලේඛන I හි අංක 03 යටතේ තොරතුරු තාක්ෂණය නිපුණතාවයට අදාළව ලබා ඇති සහතික (තොරතුරු සන්නිවේදන තාක්ෂණ විෂය යටතේ විභාගය සමත් අයදුම්කරුවන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබූ සහතිකවලට අමතරව ලබා ඇති සහතික)

**සැ.යු. -** ඔබ විසින් ඉදිරිපත් කරන උපාධි, ඩිප්ලෝමා හා සහතික පත්‍ර පාඨමාලා සහතික විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපාධි පිරිනැමීමේ ආයතනයක් ලෙස පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතික විය යුතු අතර අදාළ සහතිකවල පාඨමාලා කාලය සඳහන් නොවේ නම් සහතික නිකුත් කළ ආයතනය වෙතින් ලබා ගත් පාඨමාලා කාලය සනාථ කරන ලද ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. පශ්චාත් උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා ඉදිරිපත් කිරීමේ දී සවිස්තරාත්මක ප්‍රතිඵල සටහන ද ඉදිරිපත් කළ යුතුය. **තව ද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කරන සියලු සහතිකපත්‍ර 2020.11.06 දිනට හෝ ඊට පෙර සුදුසුකම් සම්පූර්ණ කළ ඒවා විය යුතුය.**

04. අතිරේක සුදුසුකම් සඳහා ලකුණු ලබා දීමට අවශ්‍ය සියළුම සහතිකපත් සහ සහතික කරන ලද ඡායා පිටපත් එදිනට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර පසුව ඉදිරිපත් කෙරෙන සහතිකපත් පිළිබඳව සළකා බැලීමක් සිදු නොකරන බව දන්වමි. තවද, ඇමුණුම I ආකෘතිය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සම්පූර්ණ කර ප්‍රායෝගික පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. (ඇමුණුම I ආකෘතිය www.moe.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර බාගත කරගත යුතුය.)

05. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සහ ප්‍රායෝගික පරීක්ෂණය එක් එක් විෂය යටතේ වෙන් වෙන් වශයෙන් පවත්වනු ලබන අතර ඔබ විෂයයන් කිහිපයක් සඳහා මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවකු නම් එම විෂයයන් කිහිපය සඳහා වෙන වෙනම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා සහභාගි විය යුතුය. **යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනයේ උපලේඛන I පරිදි ලකුණු ලබා දෙනු ලැබේ**.

06. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා උපරිම ලකුණු 50 ක් ලබා දෙන අතර එම පරීක්ෂණය **පාඩම් සටහන පිළියෙල කිරීම** සහ **ඉදිරිපත් කිරීම** ලෙස කොටස් දෙකකින් සමන්විතය. පළමුව, විෂයයට අදාළව එම අවස්ථාවේ දී ලබා දෙනු ලබන මාතෘකා කිහිපයක් අතුරින් අහඹු ලෙස තෝරා ගනු ලබන මාතෘකාවක් යටතේ මිනිත්තු 45 ක කාලයක් තුළ පාඩම් සටහන පිළියෙල කළ යුතුය. දෙවනුව, පිළියෙල කරන ලද පාඩම් සටහන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉදිරියේ මිනිත්තු 15 ක කාලයක දී ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය නම් පරිශීලන ග්‍රන්ථ රැගෙන ඒමේ හා තමා විසින් රැගෙන එන Laptop පරිගණකයක් මඟින් තමන් විසින්ම සපයා ගන්නා ලද අන්තර්ජාල සබඳතාවයන් ඔස්සේ වෙබ් අඩවි පරිශීලනය කිරීමේ අවස්ථාව ඇති අතර දුරකථන ඇමතුම් ලබා ගැනීමට, සමාජ මාධ්‍ය (උදා:-whatsapp, youtube, facebook, skipe වැනි) හෝ විද්‍යුත් තැපැල වැනි කිසිඳු ආකාරයකින් වෙනත් බාහිර පුද්ගලයන් හා සම්බන්ධ වී තොරතුරු ලබා ගැනීමට අවස්ථාව ලබා නොදේ. එසේම, රැගෙන එන Laptop සඳහා විදුලි සබඳතා ලබා නොදෙන බැවින් විදුලි බලය ආරෝපනය (Charge) කර රැගෙන ආ යුතු අතර ජංගම දුරකථන හෝ Tab ළඟ තබා ගැනීමට අවස්ථාව ලබා නොදේ. පාඩම් සැලැස්ම සකස් කිරීම සඳහා කඩදාසි සපයනු ලැබේ. අයදුම්කරුවන්ට ඉගෙනුම් උපකරණ හා ආධාරක අවශ්‍යතාවය පරිදි රැගෙනවිත් භාවිත කිරීමේ හැකියාව පවතී.පාඩම් සැලැස්ම සකස් කළ යුතු ආකෘතිය (ඇමුණුම II) www.moe.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇති අතර එය බාගත කර දෘඪ පිටපත රැගෙන ආ යුතුය. එසේම ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු ලබා දෙන ආකාරය "ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු පටිපාටිය" මැයෙන් ඔබගේ දැන ගැනීම සඳහා www.moe.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

**සැ.යු.** : නියමිත දින නියමිත වේලාවට යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටිය යුතු අතර එසේ නොවන අයදුම්කරුවන්ට වෙනත් අවස්ථාවක් ලබා දීම සිදුකරනු නොලැබේ.

07. මෙම යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය හා ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම හෝ එයට ඉදිරිපත් වීම ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියේ පත්වීමක් ලබා ගැනීමට හිමිකමක් නොවන බව කාරුණිකව දන්වමි.

අ.කළේ: ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්

ආර්.ඩී. ජමින්ද
ජ්‍යෝෂ්ඨ සහකාර ලේකම්
(අධ්‍යාපන සේවා ආයතන)